# 5 මැවීම

රෙබෙකා : අම්මේ, මගේ රෝස පැළේ ලස්සන මලක් පිපිලා.

අම්මා : බලන්න, අපේ වත්ත ම මල්වලින් පිරිලා. කුරුල්ලන්ගේ මිහිරි හඬ, ලස්සන පාට පාට සමනලුන්, අද කොච්චර ලස්සන දවසක් ද?

රෙබෙකා : අයියේ, ඇත්තට ම කොහොමද මේ ලස්සන විශ්වය ආරම්භ වුණේ? මේ ලස්සන, ක්‍රමානුකූල පැවැත්ම ඇති කළේ කවුද?

රෝයි : ලෝකයේ ආරම්භය හා පැවැත්ම පිළිබඳ ව විවිධ මත නැත්නම් න්‍යායයන් තියෙනවා.

රෙබෙකා : ඒ මොනවාද?

රෝයි : ප්‍රසාරණය වීමේ න්‍යාය, බිග් බැන්ග් න්‍යාය, ලාප්ලාස්ගේ නිහාරික කල්පිතය.

නයෝමි : අයියේ, මේ න්‍යායන් සත්‍ය ද?

රෝයි : ඒවායේ සත්‍ය අසත්‍යතාව තව ම විද්‍යාවෙන් ඔප්පු කරලා නැහැ.

නයෝමි : ඔප්පු උනොත් මැවීමේ කථා අසත්‍ය වෙනවා ද?

රෝයි : කොහෙත්ම නෑ.

නයෝමි : ඒ ඇයි?

රෝයි : එතකොට ඒවායින් කියවෙන්නේ දෙවියන් වහන්සේ ලෝකය මැවූ ආකාරය යි. ශුද්ධ බයිබලයෙහි කියන්නේ දෙවියන් වහන්සේ ලෝකය මැවූ ආකාරය නෙවෙයි, දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව යි. මිනිසාට බුද්ධියක් දී තියෙන්නේ ඒ ගැන සොයා බලන්නට. ඒ සඳහා විද්‍යාව උදව් වෙනවා. ශුද්ධ බයිබලයේ කථාවලින් පෙන්වා දෙන්නේ දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණන් කියලා.



5.1 රූපය - පරිසරය

## ප්‍රාග් ඉතිහාසය (උත්පත්ති 1-11)

උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ සිට එකළොස්වන පරිච්ඡේදය දක්වා කොටස ප්‍රාග් ඉතිහාසය ලෙස හැඳින්වේ. ප්‍රාග් ඉතිහාසය යනු ඉතිහාසයට පෙර යන්න යි. ඉතිහාසයට පෙර යුගය අධ්‍යනයේ දී ඓතිහාසික කරුණු ගවේෂණය කළ නොහැකි ය.

විශ්වයේ හා මිනිසාගේ ආරම්භය දෙවියන් වහන්සේගෙන් ම වූ බව ප්‍රාග් ඉතිහාසය තුළ ඇති උපමා කථා ඇසුරින් ඉදිරිපත් කරන බයිබල් කතුවරයා එහි දී බලාපොරොත්තු වන්නේ යම් ධාර්මික පණිවිඩයක් දීම මිස විශ්වය හා මිනිසා ඇති වූ ආකාරය පිළිබඳ ව ඉගැන්වීම නොවේ. එසේ නම් ප්‍රාග් ඉතිහාසය තුළ ඇති කතාන්දරවලින් උගත හැක්කේ දේවධාර්මික පණිවිඩ මිස විද්‍යාත්මක හෝ ඓතිහාසික සත්‍යතා නොවේ. ඒවා ඉදිරිපත් කරන ප්‍රධාන දේවධාර්මික පණිවිඩය නම්, දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණන් බව ය.

උත්පත්ති පොතේ මැවීම පිළිබඳ කථා දෙකක් අන්තර්ගත වේ.

1. මැවීම පිළිබඳ පළමු කථාව (උත්පත්ති 1:1-2:4අ)
2. මැවීම පිළිබඳ දෙවන කථාව (උත්පත්ති 2:4ආ-25)

## මැවීම පිළිබඳ පළමු කථාව

මෙම කථා පුවත පූජක සම්ප්‍රදායයේ සම්පාදනයකි. ජනවන්දනාත්මක රාමුවක් තුළ දේවධාර්මික අර්ථයකින් මැවිල්ල දින හතකට සීමා කර ඇත. මෙහි දී කතුවරයාගේ අරමුණු වන්නේ සබත් දිනයේ වැදගත්කම ඉස්මතු කිරීම යි. මෙයින් ගෙනෙන දේව ධාර්මික පණිවිඩය වන්නේ, දෙවියන් වහන්සේ දින හයක් තුළ ලෝකය මවා සත්වන දින නිවාඩු ගත්තා සේ අප ද එදින දෙවියන් වහන්සේ වෙනුවෙන් ශුද්ධ ලෙස ගත කළ යුතු බව ය. දෙවියන් වහන්සේ සිය ස්වරූපයට හා සමානකමට මිනිසා මවා ඇත. වෙනත් කිසිදු මැවිල්ලක් එලෙස මවා නැත. එබැවින් ඔහු අන් සියලු මැවිලිවලට වඩා උතුම් වේ.

මෙම උතුම්කම විද්‍යාමාන වන කරුණු තුනක් පහත දැක්වේ;

1. බුද්ධිය
2. නිදහස් කැමැත්ත
3. අමරණීය ආත්මය

මිනිසා අන් මැවිලිවලට වඩා උතුම් නම් ඔහුගේ බුද්ධිය හා නිදහස් කැමැත්ත යොදා ගත යුතු වන්නේ යහපත කිරීමට ය. එවිට අමරණීය ආත්මයක් ඇති ඔහුට අමරණීය ජීවිතයකට ඇතුළු වීමට හැකි වනු ඇත.

## මැවීම පිළිබඳ දෙවන කථාව

මෙම කථා පුවත යාවේ සම්ප්‍රදායයේ සම්පාදනයකි. මැවිලි අතර උසස් ම මැවිල්ල මිනිසා ය. මිනිසාට පමණක් ජීවන හුස්ම දානය කර ඇත. දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති විශේෂ සම්බන්ධතාව මින් පෙන්නුම් කරයි.

ස්ත්‍රිය මවනුයේ පුරුෂයාගේ ඉල ඇටයකිනි. හදවතට සමීප ඉල ඇටයකින් මැවීමෙන් ස්ත්‍රිය පුරුෂයාගේ වහලියක් හෝ පාලිකාවක් හෝ නොව ඔහුට සහායවන්නියකි. ඔවුන් අතර සම්බන්ධතාව ප්‍රේමය මත පදනම් වේ. තව ද ස්ත්‍රිය පුරුෂයාගෙන් ලද කොටසක් නිසා ඇය නොමැති ව පුරුෂයා ද ඔහු නොමැති ව ස්ත්‍රිය ද අසම්පූර්ණ ය. ඔවුන් දෙදෙනාට සම මානව ගරුත්වයක් සතුය. මෙම පූර්ණත්වය තුළ සැමියා හා බිරිඳ එකිනෙකාට ගෞරවයෙන් හා ප්‍රේමයෙන් තම විවාහ ජීවිතය ගත කිරීමට වගබලා ගත යුතු ය. තව ද මැවිලි අතර උතුම් ම මැවිල්ල වූ මිනිසා එම ගරුත්වය රැකෙන පරිදි ස්ත්‍රී පුරුෂ වෙනස්කම්වලට ගරුකරමින් ජීවත්වීමට මෙමගින් ආරාධනා කරනු ලබයි.

**ක්‍රියාකාරකම**

1. මැවීම පිළිබඳ පළමු කථාව අනුව මිනිසාගේ උතුම්කම පෙන්නුම් කරන ලක්ෂණයක් ලියන්න.
2. එම ලක්ෂණය විද්‍යාමාන වන කරුණු **තුන** ලියන්න.
3. මැවීමේ දෙවන කථාව අනුව මිනිසාගේ උතුම්කම පෙන්නුම් කරන ලක්ෂණය ලියන්න.
4. මිනිසාගේ උතුම්කම රැකගැනීමට ඔබ කළ යුතු කාර්යයන් **පහක්** පෙළ ගස්වන්න.



**ජීවිතයට බිඳක්**

- *දෙවියන් වහන්සේ විශ්වයේ මැවුම්කරුවාණන් බව පිළිගනිමු.*
- *දේව ස්වරූපයට මවා ඇති අපි එම අභිමානය රැකෙන ලෙස ජීවත් වෙමු.*
- *ස්ත්‍රී පුරුෂ වෙනස්කම්වලට ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වෙමු.*